සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....

ගිණුම්කරණය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු හතර බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

(01) පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද?
(1) ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම.
(2) නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව ගනුදෙනු සටහන් කිරීම සහ වාර්තා කිරීම.
(3) ගනුදෙනු හා සිද්ධි මූල්‍ය තොරතුරු බවට පරිවර්තනය කිරීම.
(4) ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම.
(5) අනාගත තීරණ ගැනීමට කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සටහන් කිරීම. (......)

(02) ''රජය විසින් ආනයන සීමා කරන ලද භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සමහරක් භාණ්ඩ වල ආනයන සීමා ලිහිල් කිරීමට සූදානමක් පවතින බව ජනමාධ්‍ය සඳහන් කරයි.'' මෙම ප්‍රකාශය හා සම්බන්ධයෙන් ගිණුම්කරණ ක්‍රියාවලියට බලපාන පරිසර සාධකය වන්නේ,
(1) ආර්ථික හා දේශපාලන (2) නෛතික (3) සමාජ හා සංස්කෘතික
(4) ශිල්පීය හා වෘත්තීය (5) තාක්ෂණික (......)

(03) ආයතනයක් සතු මෝටර් රථ වසර 10 ක් තුළ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමත් වාර්ෂික ක්ෂය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනීමටත් පහත කුමන ගිණුම්කරණ සංකල්ප පදනම සපයනු ලබයි ද?
(1) අඛණ්ඩ පැවැත්ම සහ කාලච්ඡේද (2) අඛණ්ඩ පැවැත්ම සහ ගැලපුම්
(3) කාලච්ඡේද සහ ගැලපුම් (4) ගැලපුම් සහ උපචිත
(5) අඛණ්ඩ පැවැත්ම සහ උපචිත (......)

(04) ''විකුණූ භාණ්ඩ සඳහා ලබාදුන් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනයක් කිරීම'' යන ගිණුම්කරණ පිළිවෙතට වඩාත් උචිත ගිණුම්කරණ සංකල්පය වන්නේ,
(1) ගැලපුම් (2) අඛණ්ඩ පැවැත්ම (3) විචක්ෂණ
(4) උපලබ්ධි (5) සංගතතා (......)

(05) VAT සඳහා ලියාපදිංචි ආයතනයක් පිරිවැය රු.300 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු.460 000 කට ණයට විකුණන ලදී. විකුණුම් මිල තුළ 15% ක VAT ඇතුළත් වේ. මෙම ගනුදෙනුවේ ශුද්ධ බලපෑම් ගිණුම්කරණ සමීකරණය නිරූපණය කරනුයේ,

	වත්කම් (රු.000)	වගකීම් (රු.000)	හිමිකම (රු.000)
(1)	100 කින් වැඩිවේ.	-	100 කින් වැඩිවේ.
(2)	100 කින් වැඩිවේ.	100 කින් වැඩිවේ.	-
(3)	160 කින් වැඩිවේ.	100 කින් වැඩිවේ.	60 කින් වැඩිවේ.
(4)	160 කින් වැඩිවේ.	-	160 කින් වැඩිවේ.
(5)	160 කින් වැඩිවේ.	60 කින් වැඩිවේ.	100 කින් වැඩිවේ.

(......)

(06) ව්‍යාපාරයක 2022.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 460 000 කි. එදිනට ණයගැති උපලෙජරයෙන් උපුටාගත් ශේෂ එකතුව මීට වෙනස් විය. පසුව පහත කරුණු හෙළිදරව් විය.

1) 15% ක VAT සහිත රු.92 000 කින් යුත් ණයට විකුණුම් සම්බන්ධ ඉන්වොයිසිය සම්පූර්ණයෙන්ම මගහැරීම.
2) රු.4000 ක් වූ මුදල් ලැබීම් ජර්නලයේ වට්ටම් තීරුවේ එකතුව ණයගැති පාලන ගිණුමට හර කර ඇත.
3) ණයගැතියෙකුගෙන් අයකළ පමාපොලී රු.1500 ක් ඔහුගේ ගිණුමේ සටහන් කර නැත.

ඉහත වැරදි හා මගහැරීම් නිවැරදි කළ පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ශේෂ ලැයිස්තුවේ එකතුව,

	පාලන ගිණුමේ සංශෝධිත ශේෂය (රු.)	ශේෂ ලැයිස්තුවේ එකතුව (රු.)
(1)	544 000	360 000
(2)	544 000	450 500
(3)	560 000	360 000
(4)	560 000	442 500
(5)	560 000	642 500

(......)

- **අංක 07 සහ 08 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සුපුන් ට්‍රේඩර්ස් 2023-05-20 දින රු.920 000 ක භාණ්ඩ සීමිත නඳුන් සමාගමින් ණයට මිලදී ගන්නා ලදී. මෙම ඉන්වොයිස් අගය තුළ 15% ක VAT ඇතුළත් වේ. පිරිවිතර වලට අනුකූල නොවීම නිසා ඉන්වොයිස් අගය රු.230 000 ක් වූ භාණ්ඩ 2023-05-25 දින සීමිත නඳුන් සමාගමට ආපසු යවන ලදී. 2023-06-15 දින සීමිත නමුත් සමාගමට ගෙවිය යුතු මුළු මුදල පියවීමට චෙක්පතක් නිකුත් කරන ලදී. 2023-06-20 දින ඉහත නිකුත්කළ චෙක්පත අගරු කළ බව දන්වන ලදී.

(07) ඉහත සඳහන් සියළු ගනුදෙනු එවා සිදුවූ අනුපිළිවෙළ අනුව සුපුන් ට්‍රේඩර්ස් හි පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන,

(1) ඉන්වොයිසිය, හරපත, ලදුපත, ජර්නල් වවුචරය
(2) ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ජර්නල් වවුචරය
(3) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය
(4) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය
(5) ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, හරපත, ජර්නල් වවුචරය (......)

(08) 2023-05-25 දින මිලට ගත් භාණ්ඩ සීමිත නඳුන් සමාගමට ආපසු යැවීම සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහනඃ

		හර (රු.000)	බැර (රු.000)
(1)	ණයහිමි පාලන ගිණුම	200	
	ආපසු යැවුම් ගිණුම		200
(2)	ණයහිමි පාලන ගිණුම	230	
	ආපසු යැවුම් ගිණුම		230
(3)	ණයහිමි පාලන ගිණුම	230	
	ආපසු යැවුම් ගිණුම		200
	VAT පාලන ගිණුම		30
(4)	ණයහිමි පාලන ගිණුම	200	
	VAT පාලන ගිණුම	30	
	ආපසු යැවුම් ගිණුම		230
(5)	ණයහිමි පාලන ගිණුම	264.5	
	ආපසු යැවුම් ගිණුම		230
	VAT පාලන ගිණුම		34.5

(......)

- **අංක 09 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2023-03-31 දිනට දක්ෂිණ ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ෂණයේ දී පහත වැරදි අනාවරණය විය.

A - විකුණුම් ජර්නලයේ වටිනාකම තීරුවේ එකතුව වූ රු.900 000 ක් විකුණුම් ගිණුමට රු.90 000 ක් ලෙස බැර කර තිබුණි.

B - ගෙවූ රක්ෂණ ගාස්තු රු.30 000 ක් මුදල් ගෙවීම් ජර්නලයේ දෙවරක් සටහන් කර තිබුණි.

C - යන්ත්‍රයක් මිලට ගෙන සවිකිරීම සඳහා දරන ලද රු.80 000 ක් යන්ත්‍ර අළුත්වැඩියා වියදම් ගිණුමට හර කර තිබුණි.

D - ණයහිමියන් විසින් අයකළ පමා පොලී රු.5 000 ක් ණයහිමි පාලන ගිණුම හර කර ලද වට්ටම් ගිණුමට බැර කර තිබුණි.

(09) ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇති නොවීමට හේතු වී තිබේ ද?

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) B, C හා D පමණි.
(4) C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලමය. (......)

(10) ඉහත වැරදි නිවැරදි කළ පසුව 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභයෙහි වැඩිවීම සහ එම වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

	ශුද්ධ ලාභයෙහි වැඩිවීම (රු.000)	අවිනිශ්චිත ගිණුමේ ශේෂය (රු.000)
(1)	850	810 බැර
(2)	920	810 බැර
(3)	920	810 හර
(4)	930	820 හර
(5)	930	820 බැර

(......)

(11) සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අසිත ට්‍රේඩර්ස් 2023-03-31 දිනට තොග ආගණනයේ එදිනට වූ තොගය රු.75 000 කින් අධිගණනය වී ඇත. මේ සම්බන්ධ කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදු කළ නොමැති අතර 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත.
මෙම නිසා ව්‍යාපාරයේ විකුණුම් පිරිවැයට සහ ශුද්ධ ලාභයට ඇති වන බලපෑම්,

	විකුණුම් පිරිවැය	ශුද්ධ ලාභය
(1)	රු.75 000 කින් අඩුවේ.	බලපෑමක් නොවේ.
(2)	රු.75 000 කින් අඩුවේ.	රු.75 000 කින් අඩුවේ.
(3)	බලපෑමක් නොවේ.	බලපෑමක් නොවේ.
(4)	රු.75 000 කින් වැඩිවේ.	රු.75 000 කින් වැඩිවේ.
(5)	රු.75 000 කින් අඩුවේ.	රු.75 000 කින් වැඩිවේ.

(......)

(12) පහත තොරතුරු මිල්කි යෝගට් නිෂ්පාදකයන්ගේ පොත් වලින් උපුටා ගන්නා ලදී.

	රු.000
2022-04-01 දිනට අමුද්‍රව්‍ය තොගය	3 000
2023-03-31 දින අමුද්‍රව්‍ය තොගය	4 000
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය	26 000
නිෂ්පාදන සේවකයින්ගේ වැටුප්	45 000
මුළු නිෂ්පාදන පිරිවැය	110 000

2023-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ අමුද්‍රව්‍ය මිලට ගැණුම් හා 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය කොපමණ ද?

	අමුද්‍රව්‍ය ගැණුම් (රු.000)	නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (රු.000)
(1)	27 000	39 000
(2)	27 000	71 000
(3)	30 000	39 000
(4)	30 000	71 000
(5)	30 000	97 000

(......)

(13) අසිත වෙළෙන්දෝ නිසි ආකාරයට ගිණුම් පොත් පවත්වා නොගනී. පහත තොරතුරු 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

	රු.000
2022-04-01 තොගය	400
ගැණුම්	4 000
ගෙන ඒමේ කුලී	200
විකුණුම්	5 000
ආපසු යැවුම්	100

අසිත වෙළෙන්දෝ පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරයි. 2023-03-31 දිනට තොගයේ පිරිවැය කොපමණ ද?

(1) රු.430 000 (2) රු.440 000 (3) රු.450 000 (4) රු.460 000 (5) රු.500 000 (......)

(14) පඬුවස් දෙව් එක්සත් සුබසාධක සංගමයේ 2022-12-31 දිනෙන් අවසන් වසර සඳහා සාමාජික මුදල් සම්බන්ධව තොරතුරු පහත වේ.

	රු.
2022 වසර තුළදී ආදායම ලෙස හඳුනාගත් සාමාජික මුදල් ආදායම	300 000
2021 වසරේ දී 2022 වසර සඳහා ලැබූ සාමාජික මුදල්	15 000
2023 වසර වෙනුවෙන් ලැබූ සාමාජික මුදල්	25 000
2021 වර්ෂයට අදාල හිඟ සාමාජික මුදල්	10 000
2022 වර්ෂය අදාල හිඟ සාමාජික මුදල්	20 000

2022-12-31 දිනෙන් අවසන් වර්ෂය තුළ ලැබුණු සාමාජික මුදල,

(1) රු.300 000 (2) රු.310 000 (3) රු.315 000 (4) රු.330 000 (5) රු.335 000 (......)

(15) පහත කුමන ප්‍රකාශ හවුල් ව්‍යාපාරයකට අදාලව නිවැරදි වේද?

A - හවුල්කරුවන් යොදා ඇති ප්‍රාග්ධනය ලාභාලාභ අනුපාතයට සමාන වේ නම් ප්‍රාග්ධන පොලී ගෙවීමේ අවශ්‍යතාවක් නැත.

B - 1890 හවුල් ව්‍යාපාර ආඥාපණතේ 24 වැනි වගන්තිය අනුව හවුල්කරුවන් යොදනු ලබන ප්‍රාග්ධනයට 5% පොලියක් ගෙවිය යුතුය.

C - සංචිත නොමැති අවස්ථාවක ශුද්ධ ලාභය; ප්‍රාග්ධන පොලී, හවුල් වේතන හා ලාභ කොටස් වල එකතුවට සමාන වේ.

D - 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ 42 වන වගන්තියට අනුව විශ්‍රාම යන හවුල්කරුවකුගේ හිමිකම ණය ගිණුමකට පමණක් බැර කළ යුතුය.

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D පමණි. (......)

(16) හිරු හා සඳු හවුල් ව්‍යාපාරයේ 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ ලාභය විසර්ජනය කර තිබූ ආකාරය පහත වේ.

රු.			
හවුල් වේතන -	හිරු	240 000	
	සඳු	180 000	420 000
ලාභ කොටස් -	හිරු	300 000	
	සඳු	200 000	500 000

හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේ දී රු.345 000 ක විකුණුම් ඉන්වොයිසියක් මඟහැරී තිබූ බව පසුව අනාවරණය විය. විකුණුම් වටිනාකම තුළ 15% ක VAT ඇතුළත් වේ. 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ශුද්ධ ලාභය හා හිරුට හිමි නිවැරදි ලාභ කොටස කොපමණ ද?

	නිවැරදි ශුද්ධ ලාභය (රු.000)	හිරුට හිමි ලාභ කොටස (රු.000)
(1)	1220	320
(2)	1220	400
(3)	1220	480
(4)	1265	320
(5)	1265	480

(......)

(17) LKAS 2 තොග ප්‍රමිතයට අදාළව පහත කුමන ප්‍රකාශ නිවැරදි වේ ද?

A - තොග පිරිවැයට, මිලදී ගැණුම් පිරිවැය, පරිවර්තන පිරිවැය හා අනෙකුත් පිරිවැය ඇතුළත් වේ.

B - අසාමාන්‍ය ලෙස ද්‍රව්‍ය, ශ්‍රමය හා පොදු කාර්ය අපතේ යාම් වලට අදාළ පිරිවැය තොග පිරිවැයට ඇතුළත් කෙරේ.

C - විකුණුම් වියදම් තොග පිරිවැයට අදාළ නොවේ.

D - තොගය අගය කරනු ලබන්නේ පිරිවැය හා තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් වැඩි අගයටය.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D සියල්ලම. (......)

(18) LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන දෑ ආයතනයක අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කෙරේද?

A - භාවිත අයිතිය සඳහා කල්බදු ක්‍රමයට මිලදීගත් වත්කමක මූලික කල්බදු වගකීම.

B - වෙනත් පාර්ශවයක් විසින් ලබාගත් ණය මුදලක් වෙනුවෙන් ආයතනය ඇප වී තිබීම.

C - කිසිදු සාක්ෂියක් නොමැති වෙනත් පාර්ශවයක් විසින් ආයතනයට පවරා ඇති නඩුවකි.

D - උපචිත විදුලි වියදම්.

(1) A, B හා C පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි.
(4) A හා D පමණි. (5) A, B, C හා D සියල්ලම. (......)

- **ප්‍රශ්න අංක 19 හා 20 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත භාග්‍ය පොදු සමාගමට අදාළ වේ.

විස්තරය	(රු.000)
විකුණුම්	2,500
ගොඩනැගිලි ප්‍රත්‍යාගණන මත අතිරික්තය	300
ලී බඩු විකිණීමේ ලාභ	150
ආයෝජන පොලී	50
මුළු වියදම (ආදායම් බදු වියදම ඇතුළුව)	800

2022-03-31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩනැගිලි ප්‍රත්‍යාගනනය මත රු. 200 000ක හිඟයක් ඇති වූ අතර, සමාගම එය වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

(19) 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හඳුනාගත් මුළු ආදායම සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණ ද?

	මුළු ආදායම (රු.000)	වෙනත් විස්තීරණ ආදායම (රු.000)
(1)	2500	100
(2)	2800	100
(3)	2950	300
(4)	3000	100
(5)	3000	300

(......)

(20) 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාලච්ඡේදයේ ලාභය හා මුළු විස්තීරණ ආදායම කොපමණ ද?

	කාලච්ඡේදයේ ලාභය (රු.000)	මුළු විස්තීරණ ආදායම (රු.000)
(1)	1 700	1 800
(2)	1 700	2 000
(3)	1 900	2 200
(4)	2 100	2 000
(5)	2 100	2 200

(......)

(21) නිෂ්පාදන සමාගමක් සතු වූ ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

	(රු.000)
පිරිවැය	18 000
2022-03-31 දිනට සමුච්චිත ක්ෂය	6 000
අපේක්ෂිත සුන්බුන් අගය	3 000

අපේක්ෂිත ජීව කාලය වසර 10 කි.

ගොඩනැගිලි නවීකරණය සඳහා 2022-04-01 රු.2000 000 ක් වැය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිරි ඵලදායී ජීවකාලය වසර 2 කින් වැඩි විය. අපේක්ෂිත සුන්බුන් අගය රු.1000 000 කින් වැඩි විය.

2022-04-01 දිනට ගොඩනැගිල්ලේ ක්ෂය කළ හැකි අගය සහ 2023-03-31 දිනට ධාරණ වටිනාකම වන්නේ,

	2022-04- 01 දිනට ක්ෂය කළ හැකි අගය (රු.000)	2023-03-31 දිනට ධාරණ වටිනාකම (රු.000)
(1)	10 000	12 750
(2)	10 000	14 000
(3)	11 000	14 000
(4)	11 000	12 750
(5)	12 000	12 750

(......)

(22) සීමිත අඳීන පොදු සමාගම විසින් 2023-03-01 දින කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා රු.6000 000 කට ඉඩමක් මිලදී ගන්නා ලදී. සමාගම විසින් මේ සඳහා පහත පිරිවැය දරන ලදී.

	රු.000
මිනින්දෝරු ගාස්තු	80
ඔප්පු ගාස්තු	300
අනවශ්‍ය ගස් ගලවා ඉවත් කිරීමට	100
ඉඩම වටා තාප්පයක් ඉදිකිරීමට	500
මුරකරු වේතන	60

අනවශ්‍ය ගස් දැව සඳහා විකිණීමෙන් ලද මුදල රු. 80 000 කි.

LKAS 16 (දේපල පිරියත උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගැනීමේ පිරිවැය කොපමණ ද?

(1) රු. 4 380 000 (2) රු. 6 480 000 (3) රු. 6 580 000 (4) රු. 6 880 000 (5) රු. 6 400 000

(......)

(23) සමාගමක් විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථාවක් වන්නේ,

A - අධ්‍යක්ෂ මණ්ඩලයට කැමති ඕනෑම විටක.

B - ගිණුම්කරණ ප්‍රමිතයක අවශ්‍යතාව මත.

C - අදාළ ප්‍රතිපත්තිය වෙනස් කිරීම මගින් අඛණ්ඩ පැවැත්ම තහවුරු වන විටක.

D - ආයතනයේ මූල්‍ය තත්ත්ව, කාර්ය සාධනය හෝ මුදල් ප්‍රවාහ පෙරට වඩා විශ්වාසදායී ලෙස තොරතුරු ලබා දිය හැකි විටක

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) B පමණි.

(4) A හා D පමණි. (5) B හා D සියල්ලම. (......)

(24) සීමිත දර්ශන පොදු සමාගම රු.50 ක ප්‍රතිෂ්ඨාවකට යටත්ව සාමාන්‍ය කොටස් 400 000 නිකුත් කිරීමට අයදුම්පත් කැඳවන ලද අතර සාමාන්‍ය කොටස් 500 000 ක් සඳහා අයදුම්පත් සමඟ මුදල් ලැබුණ අතර ඒවා සමානුපාතිකව සියළු කොටස් හිමියන් අතර විභජනය කරන ලදී. කොටස් නිකුත් කිරීම සඳහා රු.250 000 ක් වැය විය. මෙම කොටස් නිකුතුවට අදාළව සමාගමේ ශුද්ධ වත්කම් වෙනස්වන්නේ කොපමණකින් ද?

		රු.000
(1)	ඉහළ යෑම	5 000
(2)	ඉහළ යෑම	19 750
(3)	ඉහළ යෑම	20 000
(4)	ඉහළ යෑම	24 750
(5)	ඉහළ යෑම	25 000

(......)

- **ප්‍රශ්න අංක 25 සහ 26 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා සීමිත අතුල පොදු සමාගමේ පහත තොරතුරු සපයා ඇත.**

	(රු.000)
විකුණුම් පිරිවැය	6 400
දළ ලාභය	1 600
2022-04-01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ	2 500
2023-03-31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ	1 500
මෙහෙයුම් වියදම් (පොලී වියදම ඇතුලුව)	600
බදු වියදම්	100
2023-03-31 දිනට හිමිකම	4 500

සියළු විකුණුම් ණය පදනම මත සිදුවේ. මෙහෙයුම් වියදම් තුළ ණය පොලී රු.1 00 000 ඇතුළත් ය.

(25) සමාගමේ දළ ලාභ අනුපාතය හා ණයගැති පිරිවැටුම් අනුපාතය,

	දළ ලාභ අනුපාතය (%)	ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර)
(1)	20	2
(2)	20	4
(3)	20	5
(4)	25	4
(5)	25	5

(......)

(26) පොලී ආවරණ අනුපාතය සහ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය,

	පොලී ආවරණ අනුපාතය (වාර)	හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%)
(1)	10	20
(2)	10	25
(3)	10	45
(4)	11	20
(5)	11	25

(......)

(27) $M^{/}$ නමැති අමුද්‍රව්‍යයෙහි මාසික ඉල්ලුම ඒකක 500 කි. මෙම අමුද්‍රව්‍ය ඒකකයක ගැනුම් මිල රු.20 කි. තොග ඇණවුම් පිරිවැය ඇණවුමකට රු.15 ක් වන අතර තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක ගැණුම් මිලෙන් 10% කි.

$M^{/}$ නමැති අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය කොපමණ ද?

(1) ඒකක 300 (2) ඒකක 400 (3) ඒකක 500 (4) ඒකක 600 (5) ඒකක 900 (......)

(28) ඇඟළුම් නිෂ්පාදන සමාගමක් 2023 මාර්තු මාසය සඳහා පහත පිරිවැය දරා ඇත.

	(රු.000)
භාවිත කළ අමුද්‍රව්‍ය රෙදි	3 000
නූල්	400
බොත්තම්	100
<u>වේතන</u>	
මහන මැෂින් ක්‍රියාකරුවන්	1200
සුපරීක්ෂක හා තත්ත්ව පාලක	300
යන්ත්‍ර හා කම්හල් ගොඩනැගිලි ක්ෂය	20
විදුලිය	50
පරිපාලන සේවක වැටුප්	250

විදුලි වියදම් වලින් 3/5 ක් කර්මාන්ත ශාලාවට අදාළ වේ.

2023 මාර්තු මාසය සඳහා නිෂ්පාදන පිරිවැය හා කලාච්ඡේද පිරිවැය,

	නිෂ්පාදන පිරිවැය (රු.000)	කාලච්ඡේද පිරිවැය (රු.000)
(1)	5 000	250
(2)	5 020	270
(3)	5 050	270
(4)	5 250	270
(5)	5 300	270

(......)

(29) A නමැති භාණ්ඩයක් නිපදවා අලෙවි කිරීමට අපේක්ෂිත ආයතනයක ඇස්තමේන්තු ගත තොරතුරු පහත දැක්වේ.

ඒකකයක විචල්‍ය පිරිවැය	රු. 10
ඒකකයක විකුණුම් මිල	රු. 30
ස්ථාවර පිරිවැය	රු. 600,000

සමච්ඡේදන ලක්ෂ්‍යයේ වටිනාකම හා රු. 500,000 ක ලාභයක් ලැබීමට විකිණිය යුතු ඒකක ගණන කොපමණ ද?

	සමච්ඡේදන වටිනාකම (රු.000)	විකිණිය යුතු ඒකක ගණන
(1)	450	15 000
(2)	450	20 000
(3)	450	55 000
(4)	900	20 000
(5)	900	55 000

(......)

(30) ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය <u>අසත්‍ය</u> වේ ද?

A - ණය ගැනීම් හා පොලී ගෙවීම් සැලකිල්ලට ගනී.

B - පිළිගෙවුම් කාලය ගණනය කිරීමේ දී මුදලේ කාලීන අගය සැලකිල්ලට ගනී.

C - ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමේ දී මුදලේ කාලීන අගය සැලකිල්ලට නොගනී.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

(31) ආයතනයක කළමණාකරණ ගිණුම් තොරතුරු වලට අදාළව පහත ප්‍රකාශ සත්‍ය ද, (T) අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

	ප්‍රකාශය	සත්‍ය/අසත්‍ය
A -	කළමණාකරුවන්ගේ භාවිතය සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන යොදා ගනී.	....
B -	ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූලව තොරතුරු සම්පාදනය කරයි.	....
C -	ආයතනයේ මූල්‍ය නොවන තොරතුරු පමණක් සපයයි.	....
D -	ආයතනයක අතීත මෙන්ම අනාගත තොරතුරු යොදා ගනී.	....

- **අංක 32 සිට 33 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු අදාළ වේ.**

යතුරු පැදි මිලට ගෙන අලෙවිකරණ ව්‍යාපාරයක පහත ගනුදෙනු සිදුවිය.

A - යතුරු පැදි 10 ක් අත්පිට මුදලට මිලදී ගැනීම.

B - යතුරු පැදි 02 ක් ලාභ සහිතව ණයට විකිණීම.

C - වට්ටමකට යටත්ව ගනුදෙනු කරුවන්ගෙන් මුදල් ලැබීම.

D - යතුරු පැදියක් අයිතිකරුගේ පුතුගේ උපන් දිනයට ත්‍යාගයක් ලෙස ලබා දීම.

(32) ඉහත ගනුදෙනු නිසා ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්නුම් කරන හිමිකම් ශේෂය වැඩිවේද (I), අඩු වේ ද (D) වෙනස් නොවේ ද (NC) යන්න සඳහන් කරන්න.

ගනුදෙනුව	හිමිකමට සිදුවන බලපෑම
A	....
B	....
C	....
D	....

(33) ඉහත ගනුදෙනු වාර්තා කිරීමට භාවිත කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

ගනුදෙනුව	මූලික සටහන් පොත
A	....
B	....
C	....
D	....

(34) එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ලිපිද්‍රව්‍ය අලෙවිසැලක රු.690 000 ක ලිපිද්‍රව්‍ය ණයට මිලදී ගන්නා ලදී. මේ තුළ 15% ක VAT ඇතුළත් වේ. උප ලෙජර පවත්වාගෙන යන ව්‍යාපාරයක මෙම ගනුදෙනුව වාර්තා කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වටිනාකම සමඟ සඳහන් කරන්න.

....

....

....

(35) සීමිත ලහිරු පොදු සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ, උධෘතයේ A, B, C හා D යන අක්ෂර වලින් දක්වා ඇති එක් එක් අයිතමයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය හඳුනාගන්න.

සීමිත ලහිරු පොදු සමාගම A

2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය B

	රු.000	
<u>ජංගම නොවන වත්කම්</u>		
දේපල පිරියත උපකරණ	xxx	
භාවිත අයිතිය සහිත වත්කම්	xxx	C
<u>ජංගම වත්කම්</u>		
වෙළඳ ලැබිය යුතු දෑ	xxx	D

<u>අයිතමය</u>	<u>සංකල්පය</u>
A	....
B	....
C	....
D	....

(36) පහත එක් එක් පොදු ලෙජර් ගිණුම්වලට අදාළ වන මූල්‍ය ප්‍රකාශන මූලිකාංග සඳහන් කරන්න.

<u>ගිණුම</u>	<u>මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය</u>
A - ණයගැති පාලන	....
B - ප්‍රත්‍යාගණන සංචිත	....
C - සේවක නඩු සඳහා වන්දි ප්‍රතිපාදන	....
D - දුන් වට්ටම්	....

(37) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - ආයතනයක වත්කම් වලින් එහි සියළු වගකීම් අඩුකළ පසු වත්කම්වලට ඇති අවශේෂ ඇල්ම .... ලෙස නිර්වචනය කෙරේ.

B - මූල්‍ය ප්‍රකාශන මූලිකාංග මැනීම සඳහා යොදාගනු ලබන ගිණුම්කරණ පදනම් දෙක වන්නේ .... සහ .... යි.

C - ව්‍යාපාර ඒකකයක් විසින් පිළියෙල කරනු ලබන ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය .... පදනම මත මූල්‍ය ප්‍රතිඵල ගණනය කර දක්වනු ලබයි.

D - තොරතුරු භාවිත කරන පාර්ශව වල තීරණ වෙනස් කිරීමට මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු වලට හැකියාවක් ඇත්නම් එම තොරතුරු .... බවින් යුක්ත වේ.

- **ප්‍රශ්න අංක 38 සහ 39 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

අතුල හා බිනර 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2022.04.01 දින චන්න හවුල්කරුවෙකු ලෙස බඳවාගන්නා ලදී. මෙදින චන්න ප්‍රාග්ධනය හා කීර්තිනාමය යන දෙකම සඳහා රු.4,000,000 ක් මුදල් රැගෙන එන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගලපනු ලබයි. අතුල, බිනර හා චන්න අතර ලාභාලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙලින් 5:3:2 ක් ලෙස එකඟ විය. අතිරේක තොරතුරු පහත දී ඇත.

(i) ප්‍රාග්ධන ගිණුම

	අතුල A	බිනර B	චන්න C		අතුල A	බිනර B	චන්න C
කීර්තිනාමය	500	300	200	4/1 ඉ/ගෙ/ආ	8 000	5 000	
ප/ගෙ/ශේ.	8 100	5 100	3 800	මුදල්			4 000
				කීර්තිනාමය	600	400	
	8 600	5 400	4 000		8 600	5 400	4 000

(ii) ජංගම ගිණුම

	අතුල A	බිනර B	චන්න C		අතුල A	බිනර B	චන්න C
				4/1 ඉ/ගෙ/ආ	500	400	-
				ප්‍රාග්ධන පොළී	810	510	380
ප/ගෙ/ශේ.	1 460	1 000	440	ලාභ කොටස්	150	90	60
	1 460	1 000	440		1 460	1 000	440

(38) අතුල, බිනර හා චන්න හවුල් ව්‍යාපාරය සඳහා පහත දෑ හඳුනා ගන්න.

(අ) චන්න බඳවා ගැනීම නිසා ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමයේ වටිනාකම. රු..........................

(ආ) 2023.03.31 දිනට අතුලගේ හා චන්නගේ මුළු හිමිකම

අතුල රු.......................... චන්න රු..........................

(39) 2022.04.01 කීර්තිනාමය ගිණුම්ගත කිරීම සඳහා ජ'නල් සටහන ලියා දක්වන්න.

....

....

....

(40) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන පහත එක් එක් ප්‍රකාශය සත්‍ය ද (T), අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය/අසත්‍ය
A - තොග වල පිරිවැය නිතර නිතර ඉහළ යන උද්ධමනකාරී අවස්ථාවකදී තොග වල පිරිවැය මැනීම සඳහා භරිත සාමාන්‍ය පිරිවැය (WAC) සූත්‍රය මත ඇස්තමේන්තු කිරීම වඩාත් යෝග්‍ය වේ.	....

B - ව්‍යාපාරයක සියළුම දේපළ පිරියත හා උපකරණ මුල්වරට පිරිවැයට මිනුම්කරණය කර පසුව ප්‍රත්‍යාගණන අගයට මිනුම්කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමක් ලෙස සලකනු ලබයි. ....

C - කාර්ය සාධන බැඳීම් තෘප්තිමත් වූ පසු අයභාරය හඳුනාගැනීම කළ යුතුය. ....

D - කල්බදු වාරිකයක් ගෙවන අවස්ථාවේ පොලිය ඇතුළුව මුළු වාරිකයෙහි වටිනාකම මූල්‍ය ක්‍රියාකාරකම් තුළ හඳුනාගත යුතුය. ....

(41) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 ''LKAS 10 වාර්තාකරන කාලච්ඡේදයෙන් පසු සිදුවීම්'' ප්‍රමිතයට අනුව පහත වගන්තිය සම්පූර්ණ කරන්න.

මූල්‍ය වාර්තා සකස් කරන කාලච්ඡේදයේ අවසාන දිනයත්, මූල්‍ය වාර්තා නිකුත්කිරීම සඳහා අනුමැතිය ලබා දෙන දිනයත් අතර කාලය තුළ සිදුවන .... හා .... සිදුවීම් වාර්තාකරන කාලච්ඡේදයෙන් පසු සිදුවීම් ලෙස නිර්වචනය කරන අතර එවැනි සිදුවීම් .... හා .... සිදුවීම් යනුවෙන් දෙයාකාරයකට වර්ග කෙරේ.

(42) සීමිත ලහිරු පොදු සමාගම 2018.04.01 දින රු.1600 000 ක් වැය කර යන්ත්‍රයක් අත්පත් කර ගත් අතර එහි ඵලදායී ජීව කාලය වසර 10 ක් හා සුන්බුන් අගය රු.100 000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබිණි. 2022.04.01 දින රු.500 000 ක වියදමක් දරා මෙම යන්ත්‍රය නවීකරණය කරන ලදී. එහි ඉතිරි ඵලදායී ජීව කාලය තවත් වසරකින් වැඩි විය. සුන්බුන් අගය වෙනස් නොවීය.

LKAS 16 - දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (අ) යන්ත්‍ර ක්ෂය වටිනාකම හා (ආ) 2023.03.31 දිනට යන්ත්‍රයේ සමුච්චිත ක්ෂය වටිනාකම

(අ) යන්ත්‍ර ක්ෂය වටිනාකම රු. ....

(ආ) සමුච්චිත ක්ෂය වටිනාකම රු. ....

(43) සීමිත එක්සිත් සමාගම රුපියල් මිලියන 15 ක් වටිනා යන්ත්‍රයක් සැපයීම සඳහා සීමිත නඳුන් සමාගම සමඟ 2022.04.01 දින ගිවිසුමක් අත්සන් කරන ලදී. ගිවිසුමේ පරිදි සීමිත එක්සිත් සමාගම වසර 5 ක් සඳහා යන්ත්‍රයට නඩත්තු සේවා සැපයිය යුතු වේ. එම නඩත්තු සේවාව වෙනත් ඕනෑම පාර්ශවයකට ද ලබා ගත හැකි අතර වසරකට රුපියල් මිලියන 1 ක් නඩත්තු සේවා සඳහා අයකරනු ලැබේ. සීමිත එක්සිත් සමාගම 2022.04.01 දින සීමිත නඳුන් සමාගමට යන්ත්‍රය සැපයීම සිදුකරන ලදී. ''SLFRS - 15 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ඇතිවන අයභාරය'' ප්‍රමිතය අනුව පහත සඳහන් දෑ හඳුනා ගන්න.

(අ) ගනුදෙනුවෙහි මිල රුපියල් මිලියන ....

(ආ) ගිවිසුමෙහි ඇතුළත් කාර්ය සාධන බැඳීම් ගණන ....

(ඉ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් අයභාරය රුපියල් මිලියන ....

(44) ''LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය'' ප්‍රමිතයට අනුව වෙළඳ සමාගමක පහත ගනුදෙනු තුළින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් ද යන්න සඳහන් කරන්න.

ගනුදෙනුව	ක්‍රියාකාරකම (මෙහෙයුම්, ආයෝජන, මූල්‍ය)
A - ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීම.	....
B - වෙනත් සමාගමක කොටස් මිලදී ගැනීම.	....
C - ගෙවූ ආදායම් බදු.	....
D - දිගුකාලීන බැංකු ණයෙහි වාරිකයක් ගෙවීම.	....

(45) 2023.03.31 දිනට සමාගමක ජංගම අනුපාතය 2.5:1 ක් විය. මෙදිනට ජංගම වගකීම් රු.1 000 000 ක් විය. සමාගමේ ජංගම වත්කම් තුළ රු.700 000 ක තොග ඇතුළත් විය. ඉදිරියට කළ වියදම් නොවීය. 2023.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(අ) ජංගම වත්කම් රු. ....

(ආ) ක්ෂණික වත්කම් අනුපාතය ....

(46) නිෂ්පාදන ආයතනයක ද්‍රව්‍ය පිරිවැය පාලනය කිරීම සඳහා යොදා ගනු ලබන පහත මූලාශ්‍ර ලේඛන නිකුත් කරන ස්ථානයත් යොමු කරන ස්ථානයක් සඳහන් කරන්න.

ලියවිල්ල	නිකුත් කරන ස්ථානය	යොමුකරන ස්ථානය
A - ගැණුම් ඇණවුම්	....	....
B - ද්‍රව්‍ය අභියාචනා පත්‍රය	....	....

(47) විශේෂිත වර්ගයක ජංගම දුරකථන මිලට ගෙන විකුණනු ලබන ව්‍යාපාරයක 2023.04.01 දිනට රු.20 000 බැගින් මිලට ගත් ජංගම දුරකථන 50 ක් තිබුණි. 2023 අප්‍රේල් මාසයේ රු.30 000 ක් බැගින් ජංගම දුරකථන 200 ක් මිලට ගන්නා ලදී. ජංගම දුරකථන විකුණුම් මිල නියම කර ඇත්තේ පිරිවැයට 20% ක් ලාභ ලැබෙන පරිදිය. අප්‍රේල් මාසය තුළ ජංගම දුරකථන 150 ක් විකුණන ලදී.

තොග නිකුත් කිරීම සඳහා පෙර ඇතුළු පෙර පිට ක්‍රමය (FIFO) භාවිත කරන්නේ නම්,

(අ) 2023.04.30 දිනට තොගයේ පිරිවැය රු. ....

(ආ) 2023 අප්‍රේල් මාසයේ විකුණුම් ආදායම රු. ....

(ඉ) 2023 අප්‍රේල් මාසය සඳහා දළ ලාභය රු. ....

(48) ගිණුම්කරණ වෘත්තීය පාඨමාලාවක් පවත්වාගෙන යනු ලබන ආයතනයක් පහත එක් එක් අයිතම සඳහා සුදුසු වර්ගීකරණය (ඍජු / වක්‍ර සහ විචල්‍ය / ස්ථාවර) හඳුනා ගන්න.

පිරිවැය අයිතමය	ඍජු / වක්‍ර	විචල්‍ය / ස්ථාවර
A - පාඨමාලාව පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ කුලිය	....	
B - දේශක වරුන්ට පැය ගණන මත ගෙවන වැටුප	....	....
C - ගොඩනැගිල්ල පිරිසිදු කරන්නාගේ වැටුප	....	....
D - ප්‍රචාරණ දැන්වීම් පළකිරීමේ පිරිවැය	....	....

(49) නිෂ්පාදන සමාගමක නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත P නම් භාණ්ඩයේ ඒකකයක විචල්‍ය පිරිවැය රු.60 ක් වන අතර දායක විකුණුම් අනුපාතය 40% කි. නිෂ්පාදන ධාරිතාව ඒකක 7000 ක් වන විට මුළු නිෂ්පාදන පිරිවැය රු.800 000 ක් වන අතර ඒකක 10 000 ක් ඉක්මවා නිපදවන විට අතිරේක රු.50 000 ක ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවේ. ඒකකයක විචල්‍ය පිරිවැය හා විකුණුම් මිල වෙනස් නොවේ නම් ඒකක 12 000 ක් නිපදවා විකුණන විට දී,

(අ) ඒකකයක විකුණුම් මිල රු. ....

(ආ) මුළු නිෂ්පාදන පිරිවැය රු. ....

(ඉ) ලාභය රු. ....

(50) පහත තොරතුරු සිදුකිරීමට යෝජිත ව්‍යාපෘතියකට අදාළ වේ.

විස්තරය	රු.
ආරම්භක ආයෝජනයේ පිරිවැය	1 400 000
ආයෝජනයේ සුන්බුන් අගය	200 000
වාර්ෂික සාමාන්‍ය ලාභය	160 000
මුදල් ප්‍රවාහ ගලාඒම් වල වර්තමාන අගය	1243 000
මුදල් ප්‍රවාහ ගලායාම්වල වර්තමාන අගය	925 000

කළමණාකරණය විසින් අපේක්ෂිත ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය 25% කි. පහත එක් එක් ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය පිළිගත යුතු ද නැද්ද යන්න හේතුව සමගින් දක්වන්න.

ක්‍රමය	පාඨමාලා පිළිගනී නම් (✓) ලකුණ ද, පිළිනොගනී නම් (X) ලකුණ ද යොදන්න.	හේතුව
(අ) ආයෝජන ප්‍රතිලාභ අනුපාතය	....	....
(ආ) ශුද්ධ වර්තමාන අගය	....	....

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....

ගිණුම්කරණය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න .
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න..

(01) සීමිත නදීක පොදු සමාගමේ 2023-03-31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

ශේෂ පිරික්සුම	හර (රු.000)	බැර (රු.000)
දේපළ පිරියත හා උපකරණ		
ඉඩම් ශේෂය	20 000	
ගොඩනැගිලි (පිරිවැය)	27 000	
ලී බඩු හා උපකරණ (පිරිවැය)	8 000	
2022-04-01 දිනට සමුච්චිත ක්ෂය		
ගොඩනැගිලි		8 100
ලී බඩු උපකරණ		2 400
2023-03-31 දිනට තොගය	7 200	
වෙළඳ ලැබිය යුතු දෑ	9 500	
බෙදාහැරීමේ පිරිවැය	2 750	
පරිපාලන වියදම්	4 800	
වෙනත් වියදම්	4 200	
මූල්‍ය වියදම්	1 600	
විකුණුම් පිරිවැය	33 200	
විකුණුම්		66 500
2022-04-01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		650
ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය		1 500
යෝජිත / ගෙවිය යුතු ලාභාංශ		2 000
වෙළඳ ගෙවිය යුතු දෑ		4 700
භාවිත අයිතිය සහිත වත්කම්	4 426	
කල්බදු වගකීම		3 426
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		30 000
2022-04-01 දිනට රඳවාගත් ඉපයුම්		4 900
හිමිකම් නිකුතු ගිණුම		2 500
2022-04-01 දිනට ආදායම් බදු ප්‍රතිපාදන		300
ගෙවූ ආදායම් බදු	1 000	
මුදල් හා මුදල් සමාන දෑ	3 300	
	126 976	126 976

අතිරේක තොරතුරු :

2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් කළ යුතුය.

(i) හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතා (WAC) කරමින් තොගවල පිරිවැය මිනුම් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුවද 2023-03-31 දිනට තොගයේ පිරිවැය වැරදීමකින් පෙර පිවිසි පෙර සිට ක්‍රමයට (FIFO) මිනුම් කර එම වටිනාකම ගිණුම්ගත කර ඇත. 2023-03-31 දිනට හරිත සාමාන්‍ය ක්‍රමය මත මිනුම් කරන ලද තොගයේ පිරිවැය රු.6 800 000 කි.

(ii) ඉඩම් හා ගොඩනැගිලි 2023-03-31 දින පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

	රු.000
ඉඩම්	18 000
ගොඩනැගිලි	17 000

ඉඩම් නැවත ප්‍රත්‍යාගණන කරන ලද අතර ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලදී. පෙර වර්ෂයක ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය ශේෂ පිරික්සුමේ දක්වා ඇත. මෙම ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් ගිණුම්කරන සටහන් තබා නැත.

(iii) 2022-10-01 දින පිරිවැය රු.2 000 000 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ රු.1 500 000 කට විකුණන ලද අතර විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුම හර කර විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු ගිණුම් සටහනක් තබා නැත. මෙම ලී බඩු හා කාර්යාල උපකරණ 2019-04-01 මිලට ගෙන තිබුණි.

(iv) ඉඩම් හැර සියළුම දේපළ පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(v) 2023-03-31 දිනට සිටි වෙළඳ ණයගැතියන්ගෙන් රු.250 000 ක ණයගැතියෙක බුන්වත් වී ඇති බවට උසාවිය මගින් තීන්දුව 2023-06-20 දින ලබා දුනි. අධ්‍යක්ෂකවරු මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද්දේ 2023-06-15 දින දීය.

(vi) මෝටර් රථයක භාවිත අයිතිය වසර 04 කට ලබාගැනීම සඳහා 2022-04-01 කල්බදු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹෙන ලදී. එදින මූලික තැන්පතුව ලෙස රු.1 000 000 ක් ගෙවන ලදී. එදිනට කල්බදු වගකීමේ ආරම්භක මිනුම්කරණ වටිනාකම රු.3 426 000 ක් විය. මෝටර් රථයෙහි ඵලදායී ජීව කාලය වසර 05 ක් වන අතර සුන්බුන් අගය රු.426 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කල්බදු ගිවිසුමට අනුව 2023-03-31 දින ප්‍රථම කල්බදු වාරිකය රු.1 200 000 ක් ගෙවන ලදී. 2023-03-31 හා 2024-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු පොලිය පිළිවෙලින් රු.514 000 ක් හා රු. 411 000 ක් වේ. මෙම මෝටර් රථය පරිපාලන කටයුතු සඳහා යොදාගනු ලබන අතර කල්බදු කාලය අවසානයේ මෝටර් රථයේ අයිතිය කල්බදු ගැණුම්කරුට හිමි නොවේ. ගෙවූ බදු කල්බදු වාරිකය වෙළෙඳ ගෙවිය යුතු දෑ ගිණුමට හර කර ඇත.

(vii) සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ වගකීම් සහතික වියදම රු.450 000 ක් වූ අතර එය බෙදාහැරීම් වියදම් තුළ ගලපා ඇත. 2023-03-31 දිනට වගකීම් සහතික ප්‍රතිපාදනය රු.750 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු වගකීම ලෙස රු.1 200 000 ලෙස ඇස්තමේන්තු කර ඇත. වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු තුළ පසුගිය වර්ෂය සඳහා ගෙවූ රු.350 000 ක් ඇතුළත් වේ.

(ix) අධ්‍යක්ෂවරු භාවිත කරනු ලබන මෝටර් රථ සඳහා ඉන්ධන ගාස්තු ලෙස රු. 300 000 ක් අධ්‍යක්ෂවරයෙකු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවනු ලැබූ අතර එය වැරදීමකින් බෙදාහැරීම් පිරිවැය තුළ දක්වා ඇත. එම මුදල ඔහුට ප්‍රතිපූර්ණය කර ඇත.

(x) ගෙවූ ලාභාංශ රු.1 800 000 ක් හා අධ්‍යක්ෂවරු විසින් යෝජනා කරන ලද රු.2 000 000 ක ලාභාංශ වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇති අතර යෝජිත ලාභාංශ, ගෙවිය යුතු ලාභාංශ ගිණුමට බැර කර ඇත.

(xi) වර්ෂය තුළ රු.2 500 000 ක් හිමිකම් නිකුතුවක් කර ලැබූ මුදල්, මුදල් ගිණුමට හර කර හිමිකම් නිකුතු ගිණුමකට බැර කර ඇත.

අවශ්‍ය වන්නේ,

LKAS - 1 ''මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම'' ප්‍රමිතයට අනුව සීමිත නදීක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1) 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ අදායම් ප්‍රකාශනය.

2) 2023-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

3) 2023-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.

(ලකුණු 40)

(02) (අ) 2023-04-01 දින මෙහෙයුම් කටයුතු අරඹන ලද නිෂ්පාදන ආයතනයක සේවක වැටුප් සම්බන්ධ තොරතුරු පහත වේ.

(i) වැඩ කරන ලද පැය ගණන,

සේවකයා	සාමාන්‍ය පැය	අතිකාල පැය
නදීක	160	30
තාරුක	160	20
මාලක	150	-

(ii) සාමාන්‍ය පැයකට රු.200 ක් සහ අතිකාල පැයකට සාමාන්‍ය පැයකට ගෙවීම මෙන් දෙගුණයක් ගෙවනු ලැබේ.

(iii) මාසයක සාමාන්‍ය පැය ගණන 160 ක් හෝ, එය ඉක්මවන විට රු.5 000 ක දිරි දීමනාවක් මසකට ගෙවනු ලැබේ.

(iv) සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍ය හා සේවක දායකය පිළිවෙලින් 12% ක් හා 8% ක් වේ. සේවක භාරකාර අරමුදලට දායකය (ETF) 3% කි. EPF හා ETF ගණනය කිරීම සඳහා අතිකාල දීමනා හා දිරි දීමනා සැලකිල්ලට ගනු නොලැබේ.

(v) සේවක වැටුපෙන් අඩුකිරීම් පහත වේ.

වැටුප් අත්තිකාරම් -	නදීක	රු.7 000
	මාලක	රු.4 000

(vi) මාසය අවසානයේදී ශුද්ධ වැටුප් මුදලින් ගෙවනු ලබන අතර EPF හා ETF දායකයක් ඊළඟ මාසයේ දී ගෙවනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1) 2023 අප්‍රේල් මාසය සඳහා වැටුප් ලේඛනය.

2) i) වැටුප් හා වේතන පාලන ගිණුම.

ii) උපචිත EPF ගිණුම හා උපචිත ETF ගිණුම.

iii) 2023 අප්‍රේල් මාසය සඳහා සේවකයන්ට මුළු වියදම.

(ලකුණු 19)

(ආ) සීමිත ලංකානි පොදු සමාගම කාන්තා හා පිරිමි පාවහන් නිපදවන ආයතනයකි. එහි එකලස් හා නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින්ද ගබඩාව නමින් සේවා දෙපාර්තමේන්තුවකින් ද සමන්විත වේ. සියලු දෙපාර්තමේන්තු එකම ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලැබේ.

(i) අයවැය ගත තොරතුරු පහත වේ.

විස්තරය	එකතුව	එකලස්	නිමැවුම්	ගබඩාව
වක්‍ර ද්‍රව්‍ය (රු.000)	1,500	800	500	200
සුපරීක්ෂක වේතන (රු.000)	2,020	1,120	650	250
කුලිය (රු.000)	480	-	-	-
විදුලිය (රු.000)	200	-	-	-
ආරක්ෂක ගාස්තු (රු.000)	600	-	-	-
යන්ත්‍ර ක්ෂය (රු.000)	800	-	-	-

(ii) අනෙකුත් තොරතුරු

විස්තරය	එකතුව	එකලස්	නිමැවුම්	ගබඩාව
භූමි ප්‍රමාණය (වර්ග මීටර්)	1,600	1,000	5,000	1,000
කිලෝවොට් පැය	1,000	500	400	100
යන්ත්‍ර පිරිවැය (රු.000)	8,000	5,000	3,000	-
ආරක්ෂක නියාමකයන් ගණන	12	6	4	2
අයවැයගත ශ්‍රම පැය ගණන (වාර්ෂික)	-	18,000	10,000	-
අයවැයගත යන්ත්‍ර පැය ගණන (වාර්ෂික)	-	15,000	20,000	-
ද්‍රව්‍ය අභියාචනා පත්‍ර ඉදිරිපත් කළ වාර ගණන	40	32	8	-

(iii) ගබඩාවේ මුලු පොදු කාර්ය පිරිවැ එකලස් හා නිමැවුම් දෙපාර්තමේන්ත අතර ද්‍රව්‍ය අභියාචනා පත්‍ර ඉදිරිපත් කළ වාර ගණන අනුව විභජනය කරනු ලැබේ.

(iv) එකලස් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මතද නිමැවුම් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.

(v) පහත තොරතුරු සමාගම නිපදවන පාවහන් දෙවර්ගයට අදාළ වේ.

	පාවහන් යුගලයන් සඳහා	
	කාන්තා	පිරිමි
ප්‍රාථමික පිරිවැය (රු.)	1500	1300
සත්‍ය ශ්‍රම පැයඃ		
එකලස් දෙපාර්තමේන්තුව (පැය)	2	1
නිමැවුම් දෙපාර්තමේන්තුව (පැය)	3	2
සත්‍ය යන්ත්‍ර පැයඃ		
එකලස් දෙපාර්තමේන්තුව (පැය)	1	2
නිමැවුම් දෙපාර්තමේන්තුව (පැය)	3	3

අවශ්‍ය වන්නේ,

1) විභජන පදනම පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව. (ගබඩාවේ පිරිවැය නැවත බෙදීමද ඇතුළුව)

2) එක් එක් දෙපාර්තමේන්තු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත.

3) කාන්තා පාවහන් යුගලයක පිරිවැය.

4) පිරිවැයට 20% ක් ලාභ ආන්තිකයක් පවත්වා ගන්නේ නම් කාන්තා පාවහන් යුගල 1000 ක් විකිණීමෙන් ලැබෙන ලාභය.

(ලකුණු 21)

(මුළු ලකුණු 40)

(03) ආරක්ෂක කැමරා (CCTV) උපාංග අලවි කිරීමේ හා සවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම සඳහා 2023.04.01 දින ''මිෂන් කෙයාර්'' නමින් ව්‍යාපාරයක් සුපුන් අරඹන ලදී. 2023.04.30 දිනෙන් අවසන් මාසය සඳහා මෙම ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු පහත වේ. සියළුම මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කෙරේ.

ගනුදෙනු අංකය	ගනුදෙනුව
01	ආරම්භක ප්‍රාග්ධනය ලෙස මුදලින් රු.2 000 000 ක් ද, රු.800 000 ක් වටිනා ගොඩනැගිලි ද රු.3 200 000 ක් වටිනා ලොරි රථය ද යොදවන ලදී.
02	රු.1200 000 ක් වටිනා CCTV කැමරා හා උපාංග මිලදී ගන්නා ලද අතර ඒ සඳහා රු.900 000 ක් මුදල් ගෙවන ලද අතර ඉතිරිය ණය පදනම මත වේ.
03	සුපුන් තම නිවසේ සවි කරන ලද කැමරා හා උපාංග වල පිරිවැය රු.180 000 කි.
04	ගනුදෙනු කරුවන්ට කැමරා හා උපාංග අලවියෙන් ලද මුදල රු.300 000 ක් වූ අතර ඒ සඳහා භාවිත කළ කැමරා හා උපකරණ වල පිරිවැය රු.180 000 ක් විය.
05	ව්‍යාපාරයේ මාසික විදුලි බිල රු.5000 ක් අයිතිකරු විසින් පෞද්ගලික මුදලින් ගෙවන ලදී.
06	කැමරා හා උපාංග සවිකිරීම වෙනුවෙන් ගනුදෙනුකරුවන් ගෙන් ලැබිය යුතු මුදල රු.150 000 ක් විය. ඒ සඳහා භාවිත කළ කැමරා හා උපකරණ වල පිරිවැය රු.100 000 කි.
07	10% ක වට්ටම් අඩු කර ණයහිමියන්ට ගෙවූ මුදල රු.180 000 කි.
08	ආගමික ස්ථානයකට නොමිලේ සවි කර දුන් කැමරා උපාංග වල පිරිවැය රු.75 000 කි.
09	ව්‍යාපාරයේ මාසික දුරකථන බිල රු.2500 ක් වන අතර එය මෙතෙක් ගෙවා නැත.
10	ගනුදෙනුකරුවන්ගේ රු.7200 ක් ලද අතර දුන් වට්ටම රු.800 කි.

11 ණයහිමියන්ට ගෙවූ චෙක්පත් වලින් රු.45 000 ක චෙක්පත් අගරු වී ඇත. ලද වට්ටම අහිමි කරන ලදී.

12 මාසික දේපළ පිරියත හා උපකරණ ක්ෂය රු.40 000 කි.

13 රු.50 000 ක් පිරිවැය වූ කැමරා උපකරණ තොගයක් සොරාගෙන තිබූ අතර ඒ සඳහා රක්ෂණ ආයතනයෙන් 60% ක් වන්දි ලැබීමට නියමිතය.

14 මැයි මාසයේ නියමිත ගනුදෙනුකරුවෙකුට කැමරා සවිකිරීමක් වෙනුවෙන් ලද මුදල රු.60 000 කි.

අවශ්‍ය වන්නේ,

1) අංක 01 සිට 14 දක්වා ඇති ගනුදෙනු වල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. මෙම ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න. (ලකුණු 28)

ගනුදෙනු අංකය	වත්කම්					වගකීම්			හිමිකම
